# බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2009.07.30

වේලාව : පෙ.ව.11.45

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නගර සභා මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 03. ගරු නගර සභා මන්ත්‍රී | ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. ගරු නගර සභා මන්ත්‍රී | ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 06. ගරු නගර සභා මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 07. ගරු නගර සභා මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |
| 08. ගරු නගර සභා මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**සහභාගී නොවූවෝ :-**

01. ගරු උපසභාපති සුමේද චාමින්ද බස්නායක මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය:-**

01. නාගරික ලේකම් ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන්නේ 2009 වර්ෂයේ ජූනි මාසයට අදාළ මහ සභා රැස්වීම බවත්, ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා,ලේකම් මහතා,පුවත්පත් කලාවේදී මහතා සාදරයෙන් පිළිගන්නා බව පැවසීය.

(03) **2009.06.26 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2009.06.26 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) **පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **නිවාඩු අනුමත කිරීම - උපසභාපති, සුමේද චමින්ද බස්නායක මැතිතුමා:**

තමා අසනීප තත්ත්වයෙන් පසුවන බැවින් අද දින පැවැත්වෙන මහ සභා රැස්වීමට සහභාගි විය නොහැකි බව දන්වමින් ගරු උපසභාපති සුමේද චාමින්ද බස්නායක මැතිතුමා විසින් එවා ඇති 2009.07.30 දිනැති ලිපිය සභාගත කරන ලදුව, නිවාඩු අනුමත කිරීමට සභාව තීරණය කරන ලදී.

05:02 **කොන්ක්‍රීට් කරන ලද මාර්ගයක පැති කාණුවක් සැකසීම:**

උක්ත කරුණට අදාළව , බළන්ගොඩ ,රබර්වත්ත ,ඕළුගන්තොට ප්‍රදේශවාසීන් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඇස්තමේන්තුවක් සකස් කර , කර්මාන්ත කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

05:03 **ජල බවුසරය ලියාපදිංචි කිරීම:**

මෙම සභාව සතුව ජල බවුසර් 02 න් එක් ජල බවුසරයක් 67-3301 අංක යටතේ ලියාපදිංචි කර ඇති අතර, අනෙක් ජල බවුසරය ලියාපදිංචි කිරීමට අනුමැතිය පතමින් විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, මෙම ජල බවුසරය ලියාපදිංචි කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:04 **LapTop පරිඝනකයක් ලබාගැනීම:**

නගර සභාවේ ප්‍රයෝජනය සඳහාත් දේශණවලදී යොදා ගැනීම සඳහාත් පුහුණු වැඩ මුළු ආදියට ගෙන යාමට **LapTop** පරිඝනකයක් මිළදිගෙන ලබාදෙන ලෙස ඉල්ලමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති 2009.07.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මිළ ගණන් කැඳවා මිළදි ගැනීමට තීරණය කරන ලදී.

05:05 **බස්නැවතුම්පල නඩත්තු කටයුතු පවත්වාගෙන යාම:**

ඉහත සඳහන් කරුණට අදාළව වැඩ අධිකාරී මහතා විසින් ඉදිරිපත් කර ඇති 2009.07.27 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ නව බස්නැවතුම්පල ගොඩනැගිල්ල හා අවට පරිශ්‍රය පහත සඳහන් කාරණා නිසා විනාශයට හා අපිරිසිදු තත්ත්වයකට පත්වීම දක්නට ලැබෙන බැවින් ඒ කෙරෙහි අවධානය යොමු කර ජනතාව දැනුවත් කිරීමට සඳහා දැන්වීම් පුවරු ප්‍රදර්ශණය කිරීම සුදුසු බව එමගින් වාර්තා කර තිබුණි.

01. පරිශ්‍රය තුළ බුලත්විට කෑම.
02. පරිශ්‍රය තුළ මුත්‍රා කිරීම.
03. ගොඩනැගිලි බිත්ති මත පෝස්ටර් , දැන්වීම් ඇලවීම හා අක්‍රමත් ලෙස බැනර් එල්ලීම.

ජනතාව දැනුවත් කිරීම උදෙසා දැන්වීම් පුවරු සවිකිරීමට තීරණය කරන ලදී.

05:06 **දහම් සරණ සමාජය - පැල්මඩුල්ල:**

උක්ත කරුණට අදාළව , පැල්මඩුල්ල විද්‍යාල මාවත දහම් සරණ සමාජයේ සභාපති විසින් එවා ඇති 2009.07.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

එමගින් පැල්මඩුල්ල මව්පිය උපහාර වැඩිහිටි නිවාසයේ වැසිකිලි අපද්‍රව්‍ය ඉවත් කරගැනීම සඳහා මෙම නගර සභාවේ ගලි බවුසරය සහනදායී මිළකට ලබාදෙන ලෙස ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, මෙම ප්‍රදේශය නගර සභා බල ප්‍රදේශයට අයත් නොවන බැවින්, සහනදායී මිළකට මෙම යන්ත්‍රය සැපයිය නොහැකි බවත්, නියමිත මිළ ගණන් වලට අනුව පමණක් ලබාදිය හැකි බවත් දැන්වීමට තීරණය කරන ලදී.

05:07 **බළන්ගොඩ තානායම අළුත්වැඩියා කිරීම:**

ඉහත සදහන් කාරණයට අදාළව විෂය භාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

තානායම් ගොඩනැගිල්ලේ පැරණි විදුලි පරිපථය සකසා ඇත්තේ ඇලුමිණියම් වයර් යෙදීමෙන් වන අතර, මෙම පද්ධතිය මුළුමනින්ම අබලන් බැවින් හා වහලය අළුත්වැඩියාවේ දී ගලවා ඉවත් කල යුතුව ඇති බැවින්, අළුතින් තත් ඇද විදුලිය පරිපථය නැවත මුළුමනින්ම සකස් කල යුතු වන නිසා , මෙම කාර්යය ප්‍රදේශයේ පළපුරුදු විදුලිය කාර්මිකයකු ලවා ඉටුකරවා ගැනීම සුදුසු එමගින් වාර්තා කර තිබුණි.

ඇස්තමේන්තුවක් සකසා ඒ අනුව ද්‍රව්‍ය ලබා දී සවිකිරීමේ ගාස්තු ගෙවීමට අනුමැතිය ලබාදෙන ලදී.

05:08 **සාමය සඳහා වූ නගරාධිපතිවරුන්ගේ සමුළුව:**

උක්ත කරුණට අදාළව,ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ විසින් එවා ඇති 2009.07.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඒ අනුව යථෝක්ත සමුළුවට අදාළ හෝටල් ගාස්තු සහ ගුවන් ගමන් ගාස්තු සඳහා පහත සදහන් කරන බව එමගින් දන්වා තිබුණි.

සම්පූර්ණ වියදම - රාජකාරී ගුවන් බලපත්‍ර සඳහා රු.189,300/=
සාමාන්‍ය ගුවන් බලපත්‍ර සඳහා රු.192,500

- කොළඹ- බැංකොක් - ෆුකෝකා-සහ ආපසු ගුවන් ගමන් බලපත්‍රය
- හෝටල් ගාස්තු යුගල කාමර උදෑසන ආහාර සහිතව රාත්‍රී 05 ක් සදහා.
- ගුවන් තොටුපල සිට හෝටලය දක්වා සහ ආපසු ගුවන් තොටුපල දක්වා ප්‍රවාහන පහසුකම්.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, ඉහත සඳහන් සමුළුවට මෙම සභාවේ ගරු සභාපතිතුමා හා ගරු උපසභාපතිතුමා සහභාගී කරවීම සුදුසු බවත්, ඒ සදහා එක් අයෙකුට රු.197250/- බැගින් සභා අරමුදලින් වියදම් දැරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:09 **විමධ්‍යගත වැඩ සටහන ක්‍රියාත්මක කිරීම:**

ඕළුගන්තොට රෝහල සඳහා ජලය ලබා ගැනීමට සකස් කරන ලද ඇස්තමේන්තුව ගරු පේෂකර්ම අමාත්‍ය මහින්ද රත්නතිලක මැතිතුමාගේ උපදෙස් පරිදි මෙම සභාව වෙත යොමු කරන බව දන්වමින්, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

සභාව මගින් මෙම කර්මාන්තය ඉටුකර බිල්පත යැවීමට තීරණය කරන ලදී.

05:10 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය:**

සන අපද්‍රව්‍ය කළමනාකරණ ( තුන් අවුරුදු ) ව්‍යාපෘතියට අදාල ව්‍යාපෘති වාර්තාව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් සභාවට ඉදිරිපත් කර තිබුණි.

සෞඛ්‍ය අංශයේ සේවය කරන කම්කරුවන් සියළු දෙනාම එක් දිනක විනෝද චාරිකාවක් යෑම හා ඒ සඳහා බස් රථයට යන වියදම කොම්පෝස්ට් ගිණුමෙන් දැරීම සුදුසු බවත් එමගින් සඳහන් කර තිබුණි.

**සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට අදාළ යෝජනා :**

01. කසල ජනනය වන ස්ථානයේ දී වෙන් කිරීම- නේවාසික ප්‍රදේශවල 60% ක් ද, වාණිජ ප්‍රදේශ වල 80% ක්ද වර්ධනය කිරීම.
02. කසල එකතු කිරීමේ ක්‍රම වේදය යථාවත් කිරීම.
03. Semi Aerobic Method යටතේ සනීපාරක්ෂක කසල රඳවනයක් ඉදිකිරීම.
04. දිරා නොයන අපද්‍රව්‍ය වෙළඳාම 10% - 40% දක්වා වැඩිකිරීම.
05. නිෂ්පාදිත කාබනික පොහොර වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා කාබනික පොහොර වාර්ෂික වෙළඳාම මිලියන 04 දක්වා වැඩිකිරීම.
06. නගර සභාවේ සන අපද්‍රව්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවක් පිහිටුවීම.
07. සන අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේ ධාරිතාව සංවර්ධනය කිරීම.
08. කාබන් ක්‍රෙඩිට් වෙළඳාමට ප්‍රවිශ්ඨවීම.
09. අප ජලය කළමනාකරණ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම.
10. පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වැඩ සටහනක් ආරම්භ කිරීම.

**පොහොර වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම :**

| | | |
|---|---|---|
| 01. සාමාන්‍ය කොම්පෝස්ට් | - | 100 කි.ග්‍රෑ. |
| 02. පොස්පේට් | - | 15 කි.ග්‍රෑ. |
| 03. Night Soil | - | 30 කි.ග්‍රෑ. |
| 04. දහයියා අගුරු | - | 10 කි.ග්‍රෑ. |

මෙම ද්‍රව්‍ය මිශ්‍රකර U.C.B.Super Compost නමින් අලුත් නිෂ්පාදනයක් වෙළඳ පොළට හඳුන්වාදීමට නියමිතය. මෙම නිෂ්පාදනය 50 කි.ග්‍රෑ. මිටියක් රු.800/- ද, 25 කි.ග්‍රෑ.400/- ක් ද, 10 කි.ග්‍රෑ.මිටියක් රු.150/- , 2 කි.ග්‍රෑ.සඳහා රු.60/- අලෙවි කිරීමට නියමිත වන අතර, තොග වශයෙන් මිලට ගැනීමේ දී 20% වට්ටමක් ද ලබාදීමට නියමිතය.

මේ සඳහා අලුතින් බෑග් 10000 මිළදී ගැනීමටත් , පරණ පොහොර තොග හා අලෙවි නියෝජිතයින් ලියාපදිංචි කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකිරීමට ද යෝජනා කරන අතර, මේ සඳහා ප්‍රතිපාදන JICA ආයතනයෙන් අපෙක්ෂා කරනු ලැබේ.

**පාසැල් ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහන :**

( මේ යටතේ තෝරාගත් පාසල් 05 ක අදාළ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය )

01. සම්පත් පියස 05 ක් ඉදිකිරීම
02. ප්‍රතිචක්‍රීකරණ කසල මිළදී ගැනීම සඳහා රු.5000/- බැගින් පාසැල් වලට ලබාදීම.
03. ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා ළමුන් 150 දෙනෙකු පුහුණු කිරීම
04. දිරා නොයන අපද්‍රව්‍ය මිළදී ගැනීම ක්‍රම 03 කට සිදුකිරීම.

01. කෙළින්ම මුදල් ගෙවීම.
02. පාසැල් උපකරණ ලබාදීම.
03. Point Card පතක් ලබාදීම.

සෑම Point Card පතකට ලකුණු 1000 කින් සමන්විත වන අතර, ලකුණු 1000 සම්පුර්ණ කල විට රු.1000/- චෙක්පතින් ගෙවීම.

05. **Night Soil Treatment Plant වැඩි දියුණු කිරීම.**

01. දැනට පිටවන ජලය ටැංකියකට එකතු කර නැවත කොම්පෝස්ට් ව්‍යාපෘතියෙන් භාවිතයට ගැනීම.
02. ජලය පිරිසිදු කිරීම සඳහා අලුතින් Activate Carbon filter එකක් යෙදීම.
03. ජලයේ තත්ත්වය පිළිබඳ සෑම මාස 03 කට වරක් වාර්තා ගැනීම.
04. Night Soil සඳහා බැක්ටීරියා පරීක්ෂණයක් සිදුකිරීම.

ව්‍යාපෘති වාර්තාව හා එමගින් ඉල්ලා ඇති යෝජනා ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ලබාදුන් අතර,පොහොර මිළ ගණන් තීරණය කිරීම පසුවට කල් තබන ලදී.

05:11 **<u>ඩෙංගු සහ වසංගත රෝග මර්ධනය :</u>**

මදුරු මර්ධනය සඳහා යොදා ගන්නා ධූමායන යන්ත්‍ර එක් සභාවකට 02 ක බැගින් මිළදි ගැනීමට විධි විධාන යෙදීමට අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවක දී තීරණය කල බැවින් , තම පළාත් පාලන ආයතනයේ තිබෙන අරමුදල් උපයෝගී කරගෙන විධිමත් මිළදි ගැනීමේ පටිපාටියට යටත්ව මදුරුවන් මර්ධනය සඳහා ධූමායන යන්ත්‍ර 02 ක් මිළදි ගැනීමට කටයුතු කරන ලෙස දන්වමින්, පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් එච්.පී.කැෂියර් හේරත් මහතා විසින් එවා ඇති 2009.07.22 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මිළ ගණන් කැඳවා මිළදි ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05.12** <u>බළන්ගොඩ සතිපොළ ඉදිකිරීමේ කර්මාන්තයේ පළමු කොටස් ගෙවීම :</u>

බළන්ගොඩ සතිපොළ ඉදිකිරිම කර්මාන්තයේ පළමු කොටස් ගෙවීම වන රු.8,452,970.50 ක මුදලක් සෑම් ඩෑම් කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගමට ගෙවීම සඳහා සභා අනුමැතිය පතමින් ගණකාධිකාරී මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ගෙවීම් විස්තරයඃ

| | | |
|---|---|---|
| සතිපොළ කර්මාන්තයේ ඇස්තමේන්තුගත මුළු වටිනාකම ( වැට් රහිත ) | | 27,865,341.00 |
| පළමු වාරික මුදල 8,385,883.00 (වැට් රහිත ) | | |
| අත්තිකාරම් ගෙවීම 5,000,000x30% | (1,500,000.00) | (6,885,883.00 ) |
| | | 20,979,458.00 |

රු. 6,885,883/- ක මුදලක් ගෙවීම් කිරිමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:13 **බළන්ගොඩ,රාස්සගල ,දෙණියකුඹුර මාර්ගයඃ**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ රාස්සගල,දෙණියකුඹුර ප්‍රදේශවාසීන්ගේ අත්සන් සහිතව ඉදිරිපත් කර ඇති 2009.08.27 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙම මාර්ගය සංවර්ධනය සඳහා ලැබුණු උසාවි නියෝගය අනුව ප්‍රදේශවාසීන් විසින් මෙම මාර්ගය වැඩිදියුණු කර ජනතා අයිතියට පත්කල අතර, ඉන්පසුව මෙම මාර්ගයේ කිසිදු නඩත්තු කටයුත්තක් සිදුනොකල බැවින්, පහත සඳහන් අපහසුතාවන් පැන නැගී ඇති බව එමගින් දන්වා ඇත.

01. පිවිසුම් මාර්ගයේ ඇති අවහිරතාවය.
02. පාරේ ආරක්ෂාවට තර්ජණයක්ව පවතින පැල ඉනි වැට
03. වැසි දිනවලදී පාර දිගේ ගලා බසින ජලය වැළැක්වීම සඳහා කුඩා හියුම් පයිප්ප දෙකක් යොදා අද්දර ඇල ඔස්සේ බැය යාමට සැලැස්වීම.

පාරේ ආරක්ෂාවට තර්ජණයක්ව පවතින පැල ඉනි වැට ඉවත් කර කම්බි වැටක් ගැසීම සඳහා උපදෙස් ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:14 **කසල ඉවත් කිරීමේ ටෙන්ඩරය ඃ**

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ කසල ඉවත් කිරීමේ ටෙන්ඩරය ලබාගෙන ඇති බී.ගුණරත්න යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

තමා විසින් අදාල සේවාව නිසි පරිදි ක්‍රියාත්මක කරන අතර, සේවයට යොදා ඇති සේවකයින්ට වැඩි වැටුපක් ලබාදීම, ඔවුන්ගේ ලෙඩ දුක් කරදර වලදී උදව් උපකාර කිරීම, මාර්ගය පිරිසිදුකිරීමට අවශ්‍ය උපකරණ මිළට ගැනීම හා 5% ක රඳවා ගැනීමේ බද්දක් මෙම සභාව වෙත ගෙවීමට සිදුව තිබෙන බැවින්, තමා ඉමහත් අපහසුතාවකට ලක්ව ඇති නිසා, 2009.07.08 වන දින සිට මෙම සේවය නතර කිරීමට තමාට සිදුවන බව දන්වා තිබිණි.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, කසල ඉවත් කිරීමේ සේවාව නැවත ටෙන්ඩර් කිරීමට තීරණය කරන ලදී.

06. **මුදල් ගෙවීම් අනුමත කිරීම** ( රු.10000/- ට වැඩි ගෙවීම්)

2009.06.17 සිට 2009.07.20 දක්වා රු.10000/= ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාව ඉදිරිපත් කර තිබුණි.

| දිනය | විස්තරය | ව.අ. | මුදල |
|---|---|---|---|
| 09.06.17 | තාවකාලික කම්කරු වැටුප් ගෙවීම -2009 ජූනි මස 1 සිට 15 දක්වා. | 64-1 | 143,000.00 |
| 09.06.22 | **ජයන්ති ටයර් සෙන්ටර්**<br>227-5020 ගලි බවුසරයට ටයර් 04ක් ටියුබ් 02 හා ෆලැප් 01 ලබා ගැනීම.<br>700 x 16 ටයර් 04 x 13900/= 55,600.00<br>700 x 16 ටියුබ් 02 x 1550/= - 3,100.00<br>ෆලැප් 01 x 500/= - 500.00 | 71 | 59,200.00 |
| | **කැලණි ඒජන්සීස්**<br>නගර සභාවේ තණ කොල කපන යන්ත්‍රය වෙනුවෙන් ජපන් තල 04 ක් ලබා ගැනීම<br>bosch saw blade (japan)<br>04 x 2,915 } 11,660/} | 72 | 11,660.00 |

| | | | |
|---|---|---|---|
| | **ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස්**<br>බලන්ගොඩ තානායම අලුත් වැඩියාව<br>බැංකියවත්ත ගලිවල සවි කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම. | 76 | 21,335.25 |
| | **දේශීය ආදායම් කොමසාරිස්**<br>2009 අප්‍රේල් මැයි මාසවල රඳවා ගැනිමේ බදු මුදල් දේශිය ආදායම් කොමසාරිස් වෙත යැවීම. | 79 | 44,595.01 |
| | **පලාත් ආදායම් කොමසාරිස්**<br>2009 අප්‍රේල් මැයි මාසවල පිරිවැටුම් බදු පළාත් ආදායම් කොමසාරිස් වෙත යැවීම. | 80 | 11,483.62 |
| | **සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය.**<br>2009 මැයි මස විදුලි බිල පියවිම<br>තානායම - 23,140.35<br>තානායම් නිල නිවාස - 20,645.50<br>- **43,785.85**<br>- | 81 | 43,785.85 |
| | **රිෂානා සර්විස් ස්ටේෂන්**<br>HF 8558 ට්‍රැක්ටර් රථය 09.03.05 හා 09.06.15 දින සේවා කිරිම | 84 | 10,410.00 |
| | **ජේ.ජී.පී.වික්‍රමසිංහ**<br>2009 මැයි මස මහජන පුස්තකාලයට හා කියවිම් ශාලාවට පුවත්පත් සැපයීම. | 86 | 15,835.00 |
| | **ඩී.එම්.චන්ද්‍රසේකර**<br><br>නඩු සඳහා පෙනිසිටිමේ සේවා ගාස්තු 2006.02.09 සිට 2009.04.20 දක්වා<br>2611/ඉ - 500 - 500.00<br>2321/ඉ - 1000 - 2,000.00<br>1000<br>2015 - 1000 - 1,500.00<br>500<br>2610 - 500 - 500.00<br>2609/ඉ - 500 - 500.00<br>1000<br>3089/ඉ 3000 - 5,500.00<br>1500<br>09347 - 9500 - 9,500.00<br>09345 - 10500 - 10,500.00<br>-30,500.00 | 87 | 30,500.00 |
| | **මෙට්‍රොපොලිටන් ඔෆීස් පුද්ගලික සමාගම.**<br>ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියාව වෙනුවෙන් මුදල් ගෙවීම | 92 | 27,130.69 |
| 09.06.26 | **පී.එස්.ටයර් වර්ක්ස්**<br>සභාවේ වාහන වලින් ගලවන ලද ටයර් රි-බිල්ට් කිරීම (ටයර් ගණන 15)<br>11x28-06x9,900 = 59,400.00<br>700x15-05x4,250=21,250.00<br>700x16-02x4,100= 8,200.00<br>750x16-02x4,900= 9,800.00 | 97 | 98,650.00 |
| | **ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්**<br>බස්නැවතුම්පල ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිරිපිට වැසිදිය වැලැක්වීම සඳහා අමානෝ පියස්සක් ඉදිකිරීම.<br>10% රඳවුම් - රු.26,213.10<br>ඇප තැන්පත් - රු.13,876.00 | 98 | 40,089.00 |
| | **ආර්.රොස්ලින්**<br>සංශෝධිත විශ්‍රාම වැටුප් පාරිතෝෂිතය ගෙවීම | 100 | 13,056.00 |

| | | | |
|---|---|---|---|
| | **හර්ෂණ කලර් සෙන්ටර්**<br>තානායම අලුත් වැඩියාව වෙනුවෙන් අවශ්‍ය පොට් ලබා ගැනීම හා බැංකියවත්ත ගලි ප්‍රතිකාරක පද්ධතිය U චැනල් තීන්ත ආලේප කිරීම | 101 | 50,216.00 |
| | **සීගිරි ප්‍රින්ටර්ස්**<br>ආයුර්වේද ඖෂධ වර්ග වැයවීම පිළිබඳ දෛනික වාර්තා මුද්‍රණය කිරිම | 103 | 19,500.00 |
| | **එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස්**<br>නගර සභාවේ නො.06,04,08 නිල නිවාස අලුත් වැඩියාව ,තානායම අලුත් වැඩියාව වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම. | 104 | 49,966.50 |
| 09.06.30 | **රිචඩ් ප්‍රැන්සිස්**<br>තානායම ඉදිකිරීම හා බැංකියවත්ත ඉදිකිරීම් සඳහා අවශ්‍ය වැලි ලබා ගැනිම | 105 | 22,500.00 |
| | **යශෝධා හාඩ්වෙයාර්**<br>තානායම අලුත් වැඩියාව වෙනුවෙන්<br>4 x 4 සිවිලින් සීට් 95 ලබා ගැනීම - 95 x 385 -36575/- | 106 | 36,575.00 |
| | **L.E.C.C. මෙටල් ක්‍රෙෂර්**<br>බැංකියවත්ත වැඩබිම තානායම ඉදිකිරීම හා ප්‍රිමික්ස් ඇනීම සඳහා අවශ්‍ය ගල් ලබා ගැනීම. | 107 | 44,700.00 |
| | **සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධසේවා ස.සමිතිය**<br>තානායම අලුත්වැඩියාව වෙනුවෙන් සිමෙන්ති ලබා ගැනිම<br>50x750 – 37,500.00<br>25x785 – 19,625.00 | 108 | 57,125.00 |
| | **2009 ජූලි මාසය** | | |
| | **සෞඛ්‍ය කම්කරු තාවකාලික වැටුප්**<br>තාවකාලික කම්කරුවන් සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් 2009.06.18 සිට 2009.06.29 දක්වා මුදල් ගෙවීම | 01 | 20,000.00 |
| | **කර්මාන්ත අංශය - තාවකාලික වැටුප්**<br>2009 ජූනි මස 16 සිට 30 දක්වා කර්මාන්ත අංශයේ තාවකාලික කම්කරු, මේසන්, පින්තාරු , වඩු කාර්මික , විදුලි කාර්මික වැටුප් ගෙවිම | 01 | 163,250.00 |
| | **බී.ගුණරත්න**<br>2009.06.16 - 2009.06.30 දක්වා නගරයේ කසල එකතු කිරීමේ දීමනා ගෙවීම | 02 | 86,708.00 |
| | **සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා ස.සමිතිය**<br>2009.05.19 සිට 2009.05.25 දක්වා<br>ඩීසල් ලීටර් 111 70.20 77,992.20<br>ලීටර් 5 කෑන් 01 257.00 257.00<br>එන්ජින් ඔයිල් 02 285.00 570.00<br>ගියර් ඔයිල් ලී 5 කෑන් 1 1972.00 1,972.00<br>පැට්‍රල් ලීටර් 75 120.20 9,015.00<br>89,806.20 | 03 | 89,806.20 |
| 9.07.02 | **කැලණි ඒජන්සිස්**<br>නගර සභාවේ කම්ප්‍රෙෂර් එක සඳහා විදුලි මෝටරයක් ලබා ගැනීම | 04 | 16,430.00 |
| 09.07.03 | **එච්.එල්.ඩබ්.ඉංජිනියරින් සර්විස්**<br>227-5020 ගලි බවුසරයේ අලුත් වැඩියා කටයුතු වෙනුවෙන් මුදල් ගෙවිම | 07 | 17,003.00 |
| | | | |

| | | | |
|---|---|---|---|
| | **ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස්**<br>තානායම අලුත් වැඩියාව වෙනුවෙන් අවශ්‍ය උපාංග මිලදී ගැනිම<br>POLYCON BEND 18L – FAB – 15x12= 180.00<br>POLYCON BEND 20L – FAB – 50x15= 750.00<br>POLYCON BEND 25L – FAB – 15x18= 270.00<br>POLYCON PIPE 18MM – 24x15.19 = 364.50<br>POLYCON PIPE 20MM – 300x22.67 =6,806.25<br>POLYCON PIPE 25MM –56x31.31 =1,753.50 | 08 | 10,124.25 |
| | **U & H වීල් සර්විස්**<br>JCB යන්ත්‍රයට 12.5 X 80 X 18 ප්‍රමාණයේ වෙට්ලස් ටයර් 02 මිලදී ගැනිම | 12 | 76,382.00 |
| | **ඉන්දික එරික් සිසිල්**<br>කාර්යාල පරිශ්‍රය අලංකාර කිරීම සඳහා ඇන්තුරියම් පෝච්චි 68 ලබා ගැනීම. (68 X 450 – 30,600.00) | 13 | 30,600.00 |
| | **ඉන්දික එරික් සිසිල්**<br>ගම්පහ සිට බළන්ගොඩ දක්වා G.K.1483 අංක දරණ ට්‍රැක්ටර් රථය ප්‍රවාහනය කිරිම | 14 | 14,000.00 |
| | **ඉන්දික එරික් සිසිල්**<br>බළන්ගොඩ නගර සභාවට අයත් කොම්පෝස්ට් ව්‍යාපෘති භූමියේ අලංකාරය සඳහා අවශ්‍ය මල් ලබා ගැනීම. | 17 | 33,275.00 |
| 09.07.07 | **බළන්ගොඩ මෝටර්ස්**<br>J.D. 4684 යතුරු පැදිය අලුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනිම | 18 | 10,425.00 |
| | **ජයන්ති ටයර් සර්විස්**<br>226-7521 ටිපර් රථයට<br>700 X16 ටයර් ¾ 02 - 13900 x2 = 27,800.00<br>700 X16 ටියුබ් 02 - 1550 X2 = 3,100.00<br>ප්ලැෂ් 04 – 500 x4 = 2,000.00<br>700 X 16 ඩැග් 02 - 4100 X 2 = 8,200.00 | | 41,100.00 |
| | **ජයන්ති ටයර් සර්විස්**<br>227-5020 ගලි බවුසරයට<br>700 X16 ටයර් 02 ලබා ගැනීම<br>700 X16 ටයර් 02 = 13900 X2= 27800.00 | 21 | 27,800.00 |
| 09.07.08 | **ජාන් කොම්පියුටර් සර්විස්**<br>විදුණැන පියස මධ්‍යස්ථානය සඳහා වෙබ් කැමරා 03ක් ලබා ගැනීම | 23 | 10,200.00 |
| | **දේවි ට්‍රැක්ටර් පුද්ගලික සමාගම.**<br>G.K.1483 ට්‍රැක්ටර් රථයේ ඇන්ජිමේ සම්පූර්ණ අලුත්වැඩියාව වෙනුවෙන් මුදල් ගෙවීම | 25 | 580,046.51 |
| | **ටොයෝටා ලංකා පුද්ගලික සමාගම.**<br>ND 5124 වෑන් රථයට ඔයිල් කෑන් 06 හා ප්ලැප් 01 මිලදි ගැනීම | 26 | 17,619.57 |
| | **කුමාර මෝටර් ඩීලර්ස්**<br>ජොන් ඩියර් ට්‍රැක්ටර් රථ සේවා කිරීමට අවශ්‍ය<br>ඔයිල් ෆිල්ටර් 05 X 950 - 4,750.00<br>ඩීසල් ෆිල්ටර් 04 X3100 - 12,400.00<br>- 17,150.00 | 27 | 17,150.00 |
| 09.07.09 | **ටොයෝටා ලංකා පුද්ගලික සමාගම.**<br>NP 5124 වෑන් රථයේ පූර්ණ සේවා වෙනුවෙන් මුදල් ගෙවීම | 29 | 10,347.32 |
| | **ඩබ්.පී.එන්.පී.පෙරේරා**<br>නගර සභාවට පත්වආ ගණකාධිකාරී තුමා වෙනුවෙන් ඇඳක් මිලදී ගැනීම | 31 | 17,000.00 |

| | | | |
|---|---|---|---|
| | **ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන්වර්ක්ස්**<br>කියවීම් ශාලාව අසල දැල ගැසීම හා බස් නැවතුම්පල ජෙනරේටර් කාමරයේ කැඩී ගිය වහල අලුත් වැඩියා කිරීමේ කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම. | 32 | 16,300.00 |
| | **ඒ.එම්.ඩිස්ට්‍රිබියුටර්ස්**<br>කාර්යාලය, බස් නැවතුම්පල වීථි පහන් නඩත්තුව සඳහා අවශ්‍ය විදුලි බුබුලු ලබා ගැනීම. | 33 | 47,200.00 |
| | **එම්.ජී.පියසේන**<br>පෞද්ගලික බස්ගාල් ගාස්තු වලින් තැන්පත් ආපසු ගෙවීම | 34 | 20,250.00 |
| | **දේශීය ආදායම් කොමසාරිස්**<br>2009 අප්‍රේල් හා මැයි මාසවල අයකරන ලද ජාතිය ගොඩනැගීමේ බදු දේශීය ආදායම් කොමසාරිස් වෙත යැවීම. | 35 | 11,201.83 |
| 09.07.10 | **අධ්‍යක්ෂ , රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය**<br>වැටුප් පරිගනක ගත කිරීමේ පුහුණු වැඩ මුළුවට පාඨමාලා ගාස්තු ගෙවීම<br>2009.07.13 සිට 2009.07.18 දක්වා | 37 | 16,000.00 |
| | **U & H වීල් සර්විස් පුද්ගලික සමාගම.**<br>වවුචර අංක 12-(2009.07.03) සඳහා වැට් බදු මුදල ගෙවීම. | 39 | 10,012.08 |
| 09.07.13 | **ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර්**<br>ලේඛණගාරයේ රාක්ක ගැසීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 40 | 39,445.00 |
| | **පී.සී.සිස්ටම්ස්**<br>කාර්යාලයේ කලර් ප්‍රින්ටරය හා ලේසර් ප්‍රින්ටරය සඳහා වර්න කාට්ලේජ 03 කලු කාට්ලේජ 03 හා ලේසර් ප්‍රින්ටරයට කාට්ලේජ 01 ලබා ගැනීම | 41 | 14,850.00 |
| | **එච්.එල්.ඩබ්.එන්ටප්‍රයිසස්**<br>භූමිතෙල් ලීටර් 200 ලබා ගැනීම | 43 | 10,240.00 |
| 09.07.15 | **බී.ඒ.අයි.කුමාරසිරි**<br>කාර්යාලයේ සෞඛ්‍ය අංශය සඳහා දැන්වීම් පුවරු 01, කර්මාන්ත අංශය සඳහා පුවරු 03, පුස්තකාලය සඳහා පුවරු 02 ඇඳීම වෙනුවෙන් | 46 | 10,600.00 |
| 09.07.16 | **තාවකාලික වැටුප් (කර්මාන්ත)**<br>කර්මාන්ත අංශයේ තාවකාලික වැටුප් ගෙවීම (මේසන්, වඩුවැඩ, පින්තාරු | 50 | 175,500.00 |
| 09.07.17 | **බී.ගුණරත්න**<br>2009.07.01 සිට 2009.07.15 දක්වා නගරයේ කසල එකතු කිරීමේ දීමනා ගෙවීම. | 51 | 86,708.00 |
| | **සෞඛ්‍ය අංශය - දෛනික වැටුප්**<br>සෞඛ්‍ය අංශයේ සෞඛ්‍ය කම්කරුවන් (කානු පිරිසිදු කිරීම වෙනුවෙන් ) ගෙවීම | 52 | 21,500.00 |
| 09.07.20 | ආර්.ජී.ගුණපාල<br>2009.05.26 දිනසිට 2009.07.10 දක්වා ප්‍රිමික්ස් වඩි 242 සෑදීම වෙනුවෙන්<br>242 X 55 - 13310.00<br>භූමිතෙල් වලට අඩුකලා - 766.00<br>(5120 X 15= 766) - 2.542.00 | 56 | 12,542.00 |

| | | | |
|---|---|---|---|
| 09.07.20 | **රිචඩ් ප්‍රැන්සිස්**<br>බැංකියවත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් හා තානායම අලුත්වැඩියාව සඳහා වැලි කියුබ් 6 1/2 සැපයීම. | 54 | 24,375.00 |
| | **එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස්**<br>බළන්ගොඩ තානායම අලුත් වැඩියාව<br>හා බැංකියවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 58 | 36,581.00 |
| | **2009.06.29 සිට 2009.07.13 දක්වා රු.10,000/= ට වැඩි ගෙවීම - ලංකා බැංකුව** | | |
| 09.06.29 | **ජල සම්පාදන මණ්ඩලය**<br>2009 ජූනි මස ජලබිල පියවීම - බස්නැවතුම්පල | 04 | 33,562.80 |
| | 2009 ජූලි මාසය | | |
| 09.07.13 | **සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය**<br>2009 ජූනි මස විදුලි බිල පියවීම<br>නව බස්නැවතුම්පල | 01 | 56,441.40 |

07. **ඇස්තමේන්තු අනුමත කිරීම :**

07:01 ශ්‍රී සුදර්ශනගම අතුරු මාර්ගය කැඩී ඇති කොටස් පිළිසකර කිරීම කර්මාන්තය ඉටුකිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා ද්‍රව්‍ය ලබාදෙන ලෙස කාර්මික නිලධාරි විසින් ඉල්ලීමක් කර ඇති බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදුව, අවශ්‍ය භාණ්ඩ හා ද්‍රව්‍ය ලබාදී අනුමත සමිතියක් මගින් අදාල කර්මාන්තය ඉටුකරවා ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

07:02 බළන්ගොඩ නව පොළ භූමිය හි සංවර්ධනය
කර නොමැති කොටසේ දමා ඇති
කසල ඉවත් කිරීම රු.200,000.00

07:03 පල්ලෙකුඹුර මාර්ගය පැති බැම්ම ඉදිකිරීම
කර්මාන්තය රු. 37,117.50

ඉහත කර්මාන්තය සඳහා ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තු සභාව විසින්අනුමත කරන ලදී.

08. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ :**

නැත

**යථා පරිදි කල් දී ඇති යෝජනා:**

නැත

09. **ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම:**

09:01 **67-3301 ජල බවුසරය:**

ඉහත අංක දරණ ජල බවුසරයේ වතුර කාන්දුවන තැන් වැල්ඩින් කර ලයිට් 02 ක් සවිකර , ටැංකියේ ඇතුළත හා පිටත තීන්ත ආලේප කර අකුරු ඇඳීම යන වැඩ කොටස් සඳහා කැඳ වූ මිළ ගණන් කැඳවන ලද අතර, අදාළ මිළ ගණන් පහත දැක්වා ඇත.

| රන් ලංකා ඔටෝ ෂයින් | තෙබුවන ගරාජය | ලක්මිණී මෝටර්ස් |
|---|---|---|
| රු. 32185/- | රු.29875/- | රු.31425/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් තෙබුවන ගරාජයේ රු.29875/- ක් වූ අවම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:02 **44-7142 ට්‍රේලරය අළුත්වැඩියා කිරීම:**

ඉහත අංකදරණ ට්‍රේලරයේ දිරාගිය තහඩු ඉවත්කර අළුතින් තහඩු දමා , පිටුපස බාර් දෙක ,ෆුඩ් බෝඩ් එක අළුතින් දමා අළුත්වැඩියා කර තීන්ත ආලේප කර අකුරු ඇඳීම සඳහා කැඳ වූ මිළ ගණන් පහත දැක්වේ.

| තෙබුවන ගරාජය | ලක්මිණී මෝටර්ස් | තරංග මෝටර්ස් |
|---|---|---|
| රු.44350/- | රු.47750/- | රු.49000/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් තෙබුවන ගරාජයේ රු.44350/- ක් වූ අවම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:03 **තානායම අළුත්වැඩියාව සඳහා අවශ්‍ය පිඟන් ගඩොල් මිළදී ගැනීම**

තානායම අලුත්වැඩියාව සඳහා අවශ්‍ය කරන පිඟන් ගඩොල් මිළදි ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් දැක්වේ.

| වර්ගය හා ප්‍රමාණය | රෝයල් සෙරමික් | සරණි පික්චර් පැලස් | නිව් වික්‍රමනායක හාඩ්වෙයාර් | යශෝධා හාඩ්වෙයාර් | ගැමුණු හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|
| 400x400ෆ්ලෝ ටයිල් 01 | 227.68 | 283.50 | 280.00 | 278.00 | 280.00 |
| 200x200ෆ්ලෝ ටයිල් 01 | 69.64 | 96.00 | 98.00 | 97.50 | 96.00 |

අවම මිළ ඉදිරිපත් කර ඇති නියෝජිත ආයතනය වන රෝයල් සෙරමික් ආයතනයේ මිළ ගණන් පිළිගැනිමට සභාව තීරණය කරන ලදී.

10. **යෝජනා:**

**ගරු සභාපති,ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:**

මෙම නගර සභාව සතු ලේකම් නිල නිවස සභාපති නිල කාර්යාලය ලෙස නම් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

ඉහත යෝජනා ක්‍රියාත්මක කලහොත්, මෙම සභාවට ලේකම්වරයෙකු පත්ව පැමිණි විට එම නිලධාරී මහතාට පදිංචිවීමට නිල නිවාසයක් ලබාදීමට නොහැකි වන නිසා, මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට තමන්ගේ විරෝධතාව ප්‍රකාශ කරන බව ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් දැන්වීය.

ලේකම්වරයෙකු පත්ව පැමිණියහොත් , ඔහුට පදිංචිය සඳහා දැනට ලේකම් නිල නිවසට යාබඳව පවතින නිල නිවස ලබාදිය හැකි බව ගරු සභාපතිතුමා විසින් දැන් වූ අතර,ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ලේකම් නිල නිවස එළෙසමත් , දැනට නගර සභා කාර්යාලයේ ඉදිකර තිබෙන විවේක කාමරය සභාපති විවේක කාමර ලෙස පැවතිය යුතු බවට අදහස් පළකරන ලදී. අවසානයේ දී අදාළ යෝජනාව සම්මත නොවිණ.

11. 2009.06.01 සිට 2009.06.30 දින දක්වා මෙම සභාව සතු වාහන සඳහා වැය වු ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව,එම වාර්තාව සභා සම්මත විය.

12. **ආදායම් - වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීමඃ**

2009 වර්ෂයේ ජුනි මාසයට අදාළව ආදායම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 5889385.59 |
| වෙනත් ලැබීම් | 733953.03 |
| | ----------- |
| මුළු ලැබීම් | 6623338.62 |
| පුනරාවර්ථන වියදම් | 3111403.37 |
| වෙනත් වියදම් | 7073417.68 |
| | -------------- |
| මුළු ගෙවීම් | 10184821.05 |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

13. **වෙනත් කරුණුඃ**

13:01 **ගරු නාගරික මන්ත්‍රී - ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමාඃ**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින්, බළන්ගොඩ නගර සභා ක්‍රීඩාපිටියේ සවිකර තිබු පැරල් බාරය අබලන් වී ඇති බැවින්, එය සභා මුදල් වැයකර නවීකරණය කර නැවත එම ස්ථානයේ ස්ථාපිත කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

බළන්ගොඩ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නව දේශපාල පෙරලියක් සිදුවී ගෙන යන බව දැක්නට ලැබෙන ලැබෙන්නේ යැයි පැවසු ගරු මන්ත්‍රීතුමා , බළන්ගොඩ ආසනයට මේ වන විට සම සංවිධායකවරුන් 02 හා දිස්ත්‍රික් සංවිධායකවරයෙකු පත්ව ඇති ඇති බව පැවසීය. කෙසේ වෙතත්, බළන්ගොඩ ජනතාවට සේවය කිරීමට හැකි දේශපාලන නායකත්වය ඇතිකිරීම අප සියළු දෙනාගේම වගකීම වන අතර, එම නායකත්වය ඇති කිරීමට මුළිකත්වය ගෙන කටයුතු කරන ලෙස තමා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව දැන්වීය.

ගරු පේෂකර්ම අමාත්‍ය මහින්ද රත්නතිලක මැතිතුමා මෙම ආසනයේ සම සංවිධායක ලෙස පත්ව තිබෙන නිසා , එතුමා වෙත සංවර්ධන කටයුතු සඳහා වෙන්වන මුදල් වලින් බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධනය සඳහා එක් ගරු නාගරික මන්ත්‍රීවරයෙකුට අඩුම වශයෙන් රු.ලක්ෂය බැගින්වත් වෙන්කරදෙන ලෙස ඉල්ලීමක් කිරීම සුදුසු බැව් පැවසීය.

ගරු මන්ත්‍රීවරුන්ට ලබාදෙනු ලබන දුරකථන දීමනාව තවත් රු.500/- කින් වැඩිකිරීමට තමන් මීට පෙර පැවති සභා රැස්වීම් වලදී යෝජනා කල අතර, එම යෝජනාව ක්‍රියාත්මක කරවීමට අවධානය යොමු වී නොමැති බව පෙනී යන බැවින්, ඒ පිළිබඳව නැවත සභාවේ අවධානය යොමුකරවන බව දන්වමින් සිය කථාව අවසන් කරන ලදී.

13:02 **ගරු නාගරික මන්ත්‍රී - එම්.ටී.එම්.රූමි මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින්, බළන්ගොඩ -බණ්ඩාරවෙල මාර්ගය සංවර්ධනය කිරීමේ දී කියැන්නෑම් සමාගමේ වැඩ බිමට ලබාදුන් ජල සැපයුමෙන් කුමාරගම ප්‍රදේශයට ද ජල සැපයුමක් ලබාදිය හැකි බව ජල සම්පාදන මණ්ඩලයෙන් දැනගැනීමට ලැබුණු බව සඳහන් කරන අතර, මෙම කාර්යය කරගැනීම සඳහා සභාව මගින් අවශ්‍ය බට ප්‍රමාණය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

කහටපිටිය මාර්ගයේ ප්‍රාදේශීය සභාවට අයත් කොටස සංවර්ධන කරදෙන ලෙස අදාල බලධාරීන්ගෙන් ඉල්ලීමක් කරන ලෙස ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා, කුමාර පන්සලේ දායක සභාව වෙත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලක්ෂ මුදලක් ගරු තරුණ කටයුතු ඇමතිනී නීතිඥ පවිත්‍ර දේවි වන්නිආරච්චි මැතිණිය විසින් ලබාදුන් බව කෘතවේදීව සිහිපත් කරන අතර, එම සත් කාර්යයට මෙම නගර සභාවේ ස්තුතිය එතුමිය වෙත පළකර සිටින බවත් දන්වමින් සිය අදහස් පළකිරිම නිම කරන ලදී.

13:03 **ගරු නගර සභා මන්ත්‍රී - ධර්මසේන සමරසිංහ මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, බළන්ගොඩ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සම සංවිධායක ගරු පේෂකර්ම අමාත්‍ය මහින්ද රත්නතිලක මැතිතුමාට මෙම සභාවේ සුභාශිංසනය හා ගෞරවය මෙම අවස්ථාවේ දී පළකර සිටින අතර, බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයට අයත් ප්‍රදේශ ගණනාවක ජනතාව උග්‍ර ජල හිඟයකින් පෙළෙන බැවින්, ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරවර මොහාන් සාලිය එල්ලාවල මැතිතුමා අවශ්‍ය පසුබිම සකස් කරමින් සිටි අතර, එතුමාගේ හදිසි අභාවයත් සමඟ එම යෝජනා ක්‍රමය ද මේ වන විට අභාවයට ගොස් තිබෙන බව පැවසීය. එබැවින් ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමුකර එම ජල යෝජනා ක්‍රමය නැවත ක්‍රියත්මක කරවීමට අවශ්‍ය කටයුතු කරන ලෙස බළන්ගොඩ ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සම සංවිධායක ගරු පේෂකර්ම අමාත්‍ය මහින්ද රත්නතිලක මැතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව නිම කරන ලදී.

13:04 **ගරු නගර සභා මන්ත්‍රී -ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින් , සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර මොහාන් සාලිය එල්ලාවල මැතිතුමාගේ අවමඟුල් උත්සවය මෙම අවමඟුල් උත්සවය වෙනුවෙන් වැය වන මුදල් බළන්ගොඩ නගර සභාව, සහ බළන්ගොඩ හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවන් විසින් දැරීමට 2009.05.13 වන දින ගරු විදුලි බල හා බල ශක්ති අමාත්‍ය ඩබ්.ඩී.ජෝන් සෙනෙවිරත්න මැතිතුමා සහ සබරගමුව පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම නගර සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද රැස්වීමේ දී යෝජනා වු අතර, ඒ අනුව මෙම සභාව එම අවසන් කටයුතු වෙනුවෙන් රු.75,000/- ක මුදලක් වැයකල අතර, වෙළඳසල් වලින් ලබාගත් ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවන ලෙස වෙළඳසල්හිමියන් තමාගෙන් නිරන්තරව ඉල්ලීම් කරන බැවින්, හැකි ඉක්මණින් අදාල මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

14. **<u>අවසානයඃ</u>**

**<u>ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාඃ</u>**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ටත් , ලේකම් මහතාටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු ප.ව. 02.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.